මාධ්‍ය තුළ වන ඡායාරූප විකෘති කිරීමකින් තොරව පළ කිරීම සඳහා මාධ්‍ය සාධාරණ පරෙස්සමකින් ක්‍රියා කළ යුතු බව ශ්‍රී ලංකාවේ කර්තෘ සංසදය මගින් ඉදිරිපත් කර ඇති වෘත්තීය ප්‍රතිපත්ති මාලාව තුළ දැක්වේ. එසේම සැලකිය යුතු සෑම අනුරූපමය ඩිජිටල් වෙනස් කිරීමකම ඒ බව සඳහන් කළ යුතු බවද එහි වැඩිදුරටත් දැක්වේ.

උක්ත මාධ්‍ය ආචාර ධර්මය සඳහන් කරන්නට හේතුව වන්නේ, ඔක්තෝබර් 10 DailyFT පුවත්පතේ පළවී තිබූ ඡායාරූපයකි. එහි දැක්වෙන්නේ අගමැති රාජපක්ෂ සහ චීනයේ සිට පැමිණි දූත පිරිස, ශ්‍රී ලංකාවේ චිත්‍රයක් සහිත ඵලකයක් අල්වා ගෙන ඡායාරූපයට මුහුණ දී සිටිනා ආකාරයයි. DailyFT හි මෙම ඡායාරූපයට යටින් වූ විස්තරයේද සඳහන් වන්නේ එලෙසයි. අගමැති රාජපක්ෂ නිල ට්විටර් පිටුවේ ඔක්තෝබර් 09 දින මෙම ඡායාරූපය පළ වී තිබූ අතර, එහි දක්නට ලැබෙන්නේ, අගමැති රාජපක්ෂ හා චීන දූත පිරිසේ වූ හිටපු චීන විදේශ කටයුතු ඇමති යංග් ජියේෂි විසින් සාකච්ඡාවක නිරතව සිටිනා අයුරු පෙන්වන ඡායාරූපයක් සහිත ඵලකයක් අල්වා ගෙන, අගමැතිවරයා සහ චීන හිටපු විදෙස් කටයුතු ඇමතිවරයා ඡායාරූපයට මුහුණ දී සිටින ආකාරයයි.

මෙය ඔක්තෝබර් 11 දින වීරකේසරී පුවත්පතෙහිද මෙම දෝෂයම සහිතව පළ කොට තිබුණු අතර, අප විසින් එය මින් පෙර පෙන්වා දී ඇත (https://rb.gy/xysjzk).

කෙසේ නමුත් DailyFT මගින් ඔක්තෝබර් 13 වෙනි දින ඒ සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් පළ කරන්නට කටයුතු කර තිබූ අතර, ඒ සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කොට තිබිණි. එසේම නිවැරදි ඡායාරූපයද ඒ හා පළ කර තිබුණි. සැබවින්ම එය ප්‍රශංසනීය පියවරක් වන අතර, ආචාරධාර්මික මාධ්‍යකරණය වන්නේද එය බව සඳහන් කිරීමට අපි මෙය අවස්ථාව කර ගනිමු.
**#MediaEthicsSL #lka #EnglishPress #DailyFT**